නව කතානායක චමල් රාජපක්ෂ

ශ්‍රී ලංකා නව පාර්ලිමේන්තුව මේ නොබෝදා ප්‍රථමවරට රැස් වූ අවස්ථාවේ එහි නව කතානායකවරයා වශයෙන් ඒකච්ඡන්දයෙන් චමල් රාජපක්ෂ මහතා පත්වී ය.

චමල් ජයන්ත රාජපක්ෂ දරුවන් නව දෙනෙකුගෙන් යුත් මැදමුලන රාජපක්ෂ පවුලේ වැඩිමහල් පුත්‍රයා ය. වර්තමාන ජනාධිපතිවරයා ගේ වැඩිමහල් සොහොයුරා ය. බාල සොහොයුරු මහින්දගේ බැබලීම දැනට වසර තිහකට ඉහත දී පවා මේ ලොකු අයියා අපේක්ෂා කළ හැටි පැහැදිලි වෙන්නේ මෙසේ ය.

එනම්, 1967 දී ඔවුන්ගේ පියා වන ඩී. ඒ. රාජපක්ෂ මහතා මියගිය අවස්ථාවේ එවකට ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ නායිකාව වන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියට අවශ්‍ය වූයේ බෙලිඅත්ත ආසනය තුළ ඩී. ඒ. රාජපක්ෂ මහතා ගේ දේශපාලන ක්‍රියාදාමයන් වැඩිමහල් පුත්‍ර චමල් මගින් ඉදිරියට ගෙනයාමටය. එවකට චමල් උපපොලිස් පරීක්ෂකවරයෙකු ලෙස සේවය කළේය. මැතිනියගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ චමල් ඒ වෙනුවට ඒ අවස්ථාව සිය බාල සොහොයුරු මහින්දට දුන්නේ ය.

පියෙකුගේ අභාවයෙන් ඒ වගකීම කරටගත් වැඩිමහල් පුතෙකුගේ ස්වරූපයෙන් ඔහු තම බාල නංගිලා මල්ලිලාගේ ඉදිරි ගමන ගැන වඩා උනන්දු වීය. පවුලේ බාල අය සියළු දුක් කරදර, ගැටළු වලදී හැමවිටම බැළුවේ ලොකු අයියා චමල් දෙසය. ඔහු වගකීමෙන් යුතුව පවුලේ සියළු බර කරට ගත්තේ මහින්දට පියා ගිය දේශපාලන ගමනේ අවධානයෙන් යුතුව යන්නට අවශ්‍ය පහසුකම් හා ඉඩද සළසමිනි.

අවුරුදු දෙකක්ට වඩා කාලයක් මහින්ද රාජපක්ෂ බෙලිඅත්ත ආසනයේ ශ්‍රීලනිප සංවිධායක ලෙස ඉතා උද්‍යෝගයෙන් ඒ කටයුතු ඉටු කළේය. 1970 දී මහමැතිවරණය පැමිණි යෙන් ඊට තරඟකළ මහින්ද එවක ලාබාලම මන්ත්‍රීවරයා ලෙස පාර්ලිමේන්තුවට ගියේය. චමල් ලොකු අයියා, බණ්ඩාරනායක මැතිණියගේ ආරක්ෂක අංශයේ ප්‍රධාන නිලධාරියා ලෙස පත්කෙරුණි. පසුව චමල් පොලිස් සේවයෙන් ඉවත්ව රාජ්‍ය වෙළඳ සංස්ථාවේ ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුරට පත්වීය.

1977 මහ මැතිවරණය ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂෙත්‍රයේ විශාල වෙනසක් සිදුකර මින් එක්සත් ජාතික පක්ෂයට අති මහත් ජයග්‍රහණයක් හිමිකර දුන්නේය. එම මැතිවරණය සැබැවින්ම රාජපක්ෂවරුන්ට ගෙන ආවේ මහා නරක දසාවකි. බෙලිඅත්තෙන් මහින්ද පරාජය වීය. මුල්කිරිගලට තරඟ කළ බැසිල් පරාජය වීය. ඥාති සොහොයුරු ලක්ෂමන් රාජපක්ෂ තිස්සමහාරාමයෙන් විසිවී ගියේය. යූ ඇන් පිය බලයට ආ දිනම චමල් ට රාජ්‍ය වෙළඳ සංස්ථාවේ රැකියාව නැතිවිය.

ඊළඟ අවුරුදු කීපයේ මහින්ද රාජපක්ෂ දේශපාලනයෙන් බැහැරව නීතිඥවරයෙකු ලෙස තංගල්ලේ වැඩ කළ අතර, චමල් බෙලිඅත්තේ සිය පොල්වත්ත බලාකියාගෙන සිටියේය.

1985 දී මුල්කිරිගල ආසනයේ ඡන්ද පෙත්සමක් නිසා පැවති අතුරු මැතිවරණයට ප්‍රථම වරට චමල් රාජපක්ෂ ඉදිරිපත්ව තරඟ කළේය. එම ඡන්ද ව්‍යාපාරයේදී සිදුවූ වෙඩිතැබීමක් සම්බන්ධයෙන් සිය සොහොයුරාගේ ඡන්ද කටයුතු වලට උදව් කරමින් සිටි මහින්ද චෝදනා ලබා මාස තුනක් රිමාන්ඩ් බාරයේ පසුවූ අතර, චමල් එම අතුරු මැතිවරණ යෙන් ඡන්ද 1300 කින් පැරදුණි.

වසර හතරකට පසු ග්‍රහචාරය සුබදායක විය. 1989 මැතිවරණයෙන් චමල් රාජපක්ෂ සහ සොහොයුරු මහින්ද හම්බන්තොට දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු ලෙස පාර්ලිමේන්තුවට තේරී පත්වූහ.

1994 දී ජනතා සන්ධානයත් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියත් බලයට ආ පසු චමල් රාජපක්ෂද තේරීපත්වූ අතර ඔහුට වරාය හා ගුවන් කටයුතු අමාත්‍යාංශය හිමිවිය. ඔහු එයට වඩාත් කැමති වූයේ හම්බන්තොට වරාය හා ගුවන් තොටුපළ ඉදිකරන්නට අවකාශ ලැබෙන බැවිනි. බොහෝ කලක් තුළ සිට රාජපක්ෂවරුන්ගේ සිහිනයක් වූ එය අද මල්පල දරා තිබේ.

අද දින රාජපක්ෂවරුන්ගේ දේශපාලන යන්ත්‍රය හොඳින් ක්‍රියාත්මක වන බව අද කොයි කාටත් පෙනෙන දෙයකි. චමල්, මහින්ද, ගෝඨාභය, බැසිල් යන සිව් දෙන අද රජයේ ප්‍රමුඛ ස්ථානවල ය. කැපිලි කෙටිලි බහුල දේශපාලන ලෝකයේ ඔවුන්ගේ ස්ථාවරය ඥාති සංග්‍රහය ආදී කුමන අන්දමේ චෝදනා එල්ල වුවත් නොසැලී ඉදිරියට ගමන් කරන්නේ එයට ලැබෙන ජනතා සහයෝගයද සමගය. දුර්වලව පවතින විපක්ෂයට අද කරකියා ගන්නට කිසිවක් නැත. චමල් රාජපක්ෂ කතානායක ධුරයට පත්වීම මහින්ද ජනාධිපතිවරයාට ඉමහත් වාසියක් හා ආශීර්වාදයක් බව කීම අවශ්‍ය නොවේ. පක්ෂයේත් විපක්ෂයේත් ඒකච්ඡන්දයෙන් පත්වූ, ඒ ද්විපාර්ශ්වයේම ගෞරවයට පාත්‍රවූ කතානායකවරයෙකු සිටින රජයකට එය ඉමහත් සැනසිල්ලකි.

කලකට ඉහත චමල් රාජපක්ෂ මහතා පුවත්පතකට කියා තිබුණේ ඔහු වඩා ආශා කාර්යයන් දෙකක් ගැනය. එකක් ගස් සිටුවා ඒවා වැඩී ලොකු මහත් වෙනවා දකින්නටය. අනෙක පොලිස් නිලධාරියෙකු ලෙස සේවය කිරීමටය. අපේ පාර්ලිමේන්තු වේ විනය හා හැසිරීම ගැන මීට ඉහත බොහෝ දේ පළවී ඇත. චමල් රාජපක්ෂ මහතා අපේ රටේ කතානායක ධුරයට වඩාත් සුදුසු ඒ නිසාය.

ශ්‍රීලංකාවේ නව අගමැති දි. මු.

මේ නොබෝදා දිවුරුම් දුන් නව පාර්ලිමේන්තුවේ අළුත් අගමැතිවරයා ලෙසට සහ ශ්‍රීලංකාවේ **14** වෙනි අගමැතිවරයා වශයෙන්ද තේරුණු දිසානායක මුදියන්සේලාගේ ජයරත්න නොහොත් වඩා හුරුපුරුදු ලෙස හැඳින්වුවහොත් දි. මු. ජයරත්න මහතා දැනට අප පාර්ලිමේන්තුවේ සිටින ජ්‍යෙෂ්ඨ තම දේශපාලනඥයා වෙයි. ඔහු දේශපාලනයට පිවිසියේ **1950** දී ගම්පොළ පහළ ගම්කාර්‍ය සභා වේ දෝව කොට්ඨාශයේ ගම් සභිකයෙකු වශයෙනි.

1931 ජූනි මස **4** වෙනි දින ගම්පොළ ආසනයට අයත් දොළුව නම් ගම්මානයේ උපත ලැබූ දිමු ජයරත්න දෝව මහා විද්‍යාලයෙන් තම ප්‍රාථමික අධ්‍යාපනයද, ගම්පොළ සහිරා විදුහලෙන් සහ මහනුවර ගාන්ධි විදුහලෙන් වැඩිදුර අධ්‍යාපනයද ලබාගෙන ඇත.

ටික කලක් ගුරු වෘත්තියේ යෙදුණු හෙතෙම පසුව තැපැල් ස්ථානාධිපතිවරයෙකු ලෙස ජීවිතය ඇරඹීය. ඒ දොළුව ගමේ ම ය. ගම්සභාවෙන් දේශපාලනයට පිවිසි දි. මු. මුලින් බැඳුණේ එක්සත් ජාතික පක්ෂයටය. එස් ඩබ්. ආර්. ඩී. බණ්ඩාර නායක මහතා ශ්‍රීලංකා නිදහස් පක්ෂය පිහිටුවා ගත් පසු දි. මු. එජාපයෙන් අස්වී බණ්ඩාරනායක මහතාට එක්වීය. ඔහු ශ්‍රීලනිප යට බැඳුණේ එම පක්ෂයේ **13**වන සාමාජිකයා ලෙසටය. එවිට ඔහුගේ වයස අවුරුදු **20** කි. අද ශ්‍රීලංකා පාර්ලි මේන්තුවේ සිටින ජ්‍යෙෂ්ඨතම දේශපාලනඥයා ඔහු ය.

දිමු ජයරත්න මහතා ගැන මේ ළඟදී පළවූ පුවත් පත් ලිපි ආදියෙහි වූයේ ඔහු කිසිදින අගමැති තනතුර සඳහා හඹා නොගිය බවත්, එය තමාට යම් දිනක එනතුරු ඉතා ඉවසිල්ලෙන් බලා සිටි කෙනෙකුද ලෙසිනි. එය සැබැවක් යයි දිමු ගැන දන්නා බොහෝ අය කියති. ඔහු කිසි දිනක බලයට කෑදර වූ පුද්ගලයෙකු නොවීය. තමාට ලැබුණු තනතුරු පවා ඔහු අනෙක් හිතවතුන්ට පිදූ මිනිසෙකි. ශ්‍රීලංකා නිදහස් පක්ෂයට දිමුගේ ඇති පක්ෂපාතිත්වය වෙනස් නොවන්නකි.



නව අගමැති දි. මු. ජයරත්න මහතා

ඇමතිවශයෙන්ද ඊට අමතරව **2004** හා **2005** වසර වලදී උඩරට සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික සංවර්ධන ඇමති ධුරයන්ද උසුලා **2007** දී වැවිලි කර්මාන්ත ඇමති ධුරයට පත්ව එහි අගමැති පදවිය ලබන තෙක් සේවය කර ඇත.

දිමු ජයරත්න මහතාට දියණියන් දෙදෙනෙක් හා පුතෙක් සිටිති. එක් දියණියක් විවාහව ජයරත්න මහතා පාර්ලිමේන්තුවට ප්‍රථම වරට පිවිසියේ **1970** දී ශ්‍රීලනිප යෙන් ගම්පොළ ආසනයට තරඟකිරීමෙනි. පක්ෂ විපක්ෂ දේශපාලකයින් අතර ඔහු වඩාත් කැපී පෙනුණේ විචිත්‍ර කථිකත්වය නිසාය. **1977** දී ජේ ආර් ජයවර්ධන මහතාගේ නායකත්වයෙන් යුතු එක්සත් ජාතික පක්ෂය ජය ගනිද්දි මැතිණියගේ පොදු පෙරමුණු රජය පරාජයට පත්විය.ද ඒ සමග දිමු ජයරත්නද ගම්පොළින් පරාජයට පත්විය.

යළිත් **1989** දී ගම්පොළ අසුන තරඟ කොට ජයගත් දිමු ජයරත්න මහතා **1994** දී පිහිටවූ පොදුජන එක්සත් පෙරමුණු රජයේ ඉඩම් හා කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන්ද **2000** දී කෘෂිකර්ම ආහාර හා සමූපාකාර ඇමති වහයෙන්ද **2003** දී තැපැල් හා විදුලි සංදේශ සිටින්නේ තරුණ උප ඇමතිවරයෙකු වන දුමින්ද දිසානායක සමගය. තම පුත්‍රයා දැන්ම දේශපාලනයට පිවිසෙනවාට දිමු අකමැතිය. ඉගෙනුම අවසන් කර දැනුම මුහුකුරා ගියාට පසු අවශ්‍ය නම් දේශපාලනයට ආවාට කමක් නැතැයි තම පුතා ගැන සඳහන් කරන විට මේ නව අගමැතිවරයා කියයි.

පාර්ලිමේන්තුවේ කළ සිය කතාවේදී දිමු ජයරත්න මහතා පැවසූයේ විපක්ෂයට රජයේ කටයුතු විවේචනය කර රජය හරි පැත්තට ගැනීමට අයිතියක් ඇති බවයි. එසේම විපක්ෂය පෙන්වා දෙන කරුණු සලකා බලා නිවැරදි කරගත යුතු තැන් නිවැරදිකර ගැනීමට රජයටද වගකීමක් ඇති බවත් ඔහු අවධාරණයෙන් කියා සිටියේය.



දි. මු. ජයරත්න මහතා නව අගමැතිවරයා වශයෙන් පත්වීම ලබාගත් අවස්ථාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඔහුට සුබ පැතූ අයුරුය මේ. පින්තූරයේ මැද සිටින්නේ ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතාය.

නව රජය වැඩ අරඹයි!

1 වෙනි පිටුවෙන්.....

ව්‍යවසාය සංවර්ධනය යනුවෙන් හැඳින්වේ. තවෙකක් **රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධනය** වී ඇත. පුනරුත්ථාපන සහ බන්ධනාගාර වෙනුවට **පුනරුත්ථාපන සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණය** වෙයි. කම්කරු සබඳතා වෙනුවට **කම්කරු සබඳතා එළදායිතා සංවර්ධනය** වී ඇත.

මේ කාර්ය අරභයා ටික කාලයක සිට සංවිධානාත්මක කටයුතු කළ බවක ලකුණු පෙනී යයි. මෙම කාර්යයට පදනම්වී ඇත්තේ **1960** ගණන් වල ජපානය යුද්ධයෙන් පසු ආර්ථික සංවර්ධනය සඳහා යොදාගත්, එයට පසු **1980** ගණන්වල සිට ඉක්මනින් ආර්ථික සංවර්ධනයට යොමු වූ රටවල් සිය ආකෘතිය ලෙස ගත් **සංවර්ධන රාජ්‍යය Development State** යන සංකල්පයයි. අද බොහෝ ඉදිරියට යන බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය, දකුණු කොරියාව, තායිවානය සහ මැලේසියාව වැනි රටවල් මෙම සංකල්පය මත ගමන් කරන රටවල් වෙති. මේ නව නැම්මක් අනුව යන ගමනට ඒ ඒ අමාත්‍යාංශවලද අභ්‍යන්තර ප්‍රතිසංවර්ධනය අවශ්‍ය වෙනු ඇත. රාජ්‍ය පරිපාලන අංශ පවා සම්ප්‍රදායික රාජකාරිවලින් ඔබ්බට යමින් කළමනාකරණ **Management** කාර්ය ඉටුකරන අංශ බවට හැරවිය යුතුය. පැරණි කාර්ය සංවිධාන පොත පසෙකට දමා නිලධාරීන්ට පවා කළමනාකරණ භූමිකාවකට යොමුකරලීමේ ප්‍රගුණවීම් අවශ්‍ය වනු ඇත.

මෙසේ අප අමාත්‍යාංශ ප්‍රතිසංස්කරණය කරලීමකින් තොරව ඉදිරියට යෑම අසීරු වනු ඇත. ඒ ඒ අමාත්‍යාංශ මේ සඳහා ඉලක්ක වැඩසටහන් සකස්කොට ක්‍රියාත්මක කරවිය යුතුය. ආර්ථික සංවර්ධන මණ්ඩලය යටතේ මේවායේ ඉදිරි ප්‍රගතිය නිරන්තරවම මැනෙන බැවින් අමාත්‍යාංශ අවදිව සිටිනු අත්‍යවශ්‍ය වෙයි. ඇත්ත වශයෙන්ම අප රට නව මගක යැවීමක් මෙහි අරමුණ වෙයි.

මේ මුල් කාර්යය සඳහා අරමුණු පදනම් වී ඇත්තේ **මහින්ද චින්තනයේ ඉදිරිගමන** නමැති මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇති දර්ශණයයි. එම දර්ශනයට ජීවන හුස්ම පිඹීමක් මේ නව ඇමති මණ්ඩලය පදනම් කරගත් වැඩ පිළිවෙල කරලයි. මෙම කටයුත්ත අප රටේ තත්වයන් අනුව හැල හැප්පිලි ආදියට තුඩු දෙනු ඇත. ඒවා මග හරවාගෙන ඉදිරියට ගෙනයාමේ වගකීම ඇමතිවරුන්ට පැවරෙන බවක් පෙනේ. මේ රජයේ ප්‍රයත්නයන්ට රටේ ඉදිරි සංවර්ධනය අගයන අපේක්ෂාකරන සියලු දෙනාගේ සහාය ලැබිය යුතුය. එසේම මේ ගමන ඉදිරියට යෑමට හැකිවේවායි අපි පතමු!

ඔබ සැමට සුබ අනාගතයක් ! ජයවේවා !